# 8 ශ්‍රේණිය සිංහල

## 09 ඒකකය - 2022

# අවුරුදු සිහිනය



**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

08 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍ර 2ක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# ０9. අවුරුදු සිහිනය

1929 නොවැම්බර් මස 12 වන දින ගාල්ල යටලමත්තේ දී උපන් ගුණදාස අමරසේකර මහතා වෘත්තියෙන් දන්ත වෛද්‍යවරයෙකි. එහෙත් ඔහු වඩාත් ප්‍රකට වී සිටින්නේ ලේඛකයකු ලෙසිනි. මේ පාඩමට ඇතුළත් වන්නේ ඔහුගේ රතු රෝස මල කෙටිකතා සංග්‍රහයෙන් උපුටා ගත් කතාවකි. කෙටිකතාවක ස්වභාවය හඳුනා ගෙන කෙටිකතා රස වින්දනයට යොමු වීමට අවශ්‍ය පසුබිම මේ පාඩමෙන් සම්පාදනය කෙරෙයි.



## ගුණදාස අමරසේකර කාව්‍ය සංග්‍රහ:

- ✓ භාව ගීත
- ✓ අමල් බිසෝ
- ✓ උයනක හිඳ ලියූ කවිv
- ✓ ආවර්ජනා
- ✓ අසක් දා කව
- ✓ මතක වත

## ගුණදාස අමරසේකර නවකතා:

- ✓ කරුමක්කාරයෝ
- ✓ යළි උපන්නෙමි
- ✓ දෙපා නොලද්දෝ
- ✓ ගන්ධබ්බ අපදානය
- ✓ අසත්‍ය කතාවක්
- ✓ ප්‍රේමයේ සත්‍ය කතාව
- ✓ ගමනක මුල



## ගුණදාස අමරසේකර කෙටිකතා සංග්‍රහ:

- ✓ රතු රෝස මල,
- ✓ ජීවන සුවඳ
- ✓ එක ම කතාව
- ✓ එක්ටැමෙන් පොළොවට
- ✓ කතා පහක්
- ✓ ගල් පිළිමය සහ බොල් පිළිමය
- ✓ මරණ මංචකයේ දුටු සිහිනය
- ✓ පිළිම ලොවයි පියවි ලොවයි,
- ✓ විල්තෙර මරණය

- ඉතා කෙටි කාලයක දී සිදුවීම් කීපයක් පමණක් කියවෙන කෙටි වූ කතාව කෙටිකතාවකි. සාර්ථක කෙටිකතාවල ඉහත ලක්ෂණ කිහිපයකි.

✓ කෙටිකතාවක ඇත්තේ ප්‍රධාන සිද්ධි එකකි. අනෙකුත් සිද්ධි ඒ ප්‍රධාන සිද්ධියට අදාළ වන ප්‍රධාන සිද්ධිය හැඩ කෙරෙන අවශේෂ සිද්ධි වීම.
✓ දම්වැලක පුරුක් මෙන් සිද්ධිවල මනා සම්බන්ධයක් දැකිය හැකි වීම.
✓ පාඨක සිතට දුක, අනුකම්පාව, සතුට, ආශාව, උපහාසය වැනි හැඟීම් දැනෙන ආකාරයට කතාව ඉදිරිපත් කර තිබීම.
✓ භාෂාව මගින් රූප මවමින් නිර්මාණය රසවත් කිරීම.
✓ ඒ ඒ අවස්ථාවට හා ඒ ඒ සමාජ පරිසරයට ගැළපෙන ලෙස භාෂාවේ වචන හැසිර වීම.
✓ සංකේත භාවිත කර තිබීම.
✓ ප්‍රධාන චරිත ඉතා සීමා සහිත වීම.
✓ පාඨක සිතෙහි කුතූහලය (සොයා දැන ගැනීමේ ආශාව) ඇති කරවීම.

**අවබෝධය**

1. නිවසින් පිටව ජීවත් වීමට පියසේනට සිදු වූයේ ඇයි?
2. මවගේ පමා වීම ගැන පියසේන බියටත් දුකටත් පත් කළ සිතිවිල්ල විස්තර කරන්න.
3. මව පිළිබඳව වූ සිතිවිල්ල මොහොතකට සිතෙන් ඉවත් වූ බව දැක්වෙන ප්‍රකාශය උපුටා දක්වන්න.
4. ගෙදර යෑමට පියසේන තුළ වූ ආශාවෙන් අයුතු ලෙස ප්‍රයෝජන ගත්තේ කවුරු ද?
5. පියසේන දුටු සිහිනයෙන් කතුවරයා ඉඟි කරන්නේ කුමක් දැයි ඔබේ අදහස් දක්වන්න.

**අවබෝධය**

1. ඔහුගේ පියා මිය යාමත් සමග ඇති වූ අග හිඟ කම් නිසා පොහොසත් ගෙදරක වැඩට යාමට සිදු වීමෙන්

2. දැනට සුමානයකට පමණ පෙර ඔහු කඩේ යන විට පාරේ ගිය ගැහැනියක ලොරියක හැපී වැටෙනු ඔහු දැක්කේ ය. ඈ වැටුණු වහා ම මිනිස්සු ඒ වටා රැස් වූහ. ඇගේ හැට්ටය ලෙයින් තෙත්වී ගියේ ය. ඈ මැරෙන්නට ඇතැයි ඔහුට සිතුණේ ය. තම මවටත් එසේ වන්නට ඇතැයි ඔහුට සිතුණි.

3.

- ✓ ඒ කෙරෙහි ඇදී ගිය සිත් ඇති ඔහුට තමා පැමිණි පණිවුඩය ගැන ද අම්මා ගැන ද මොහොතකට අමතක විය.
- ✓ තමා මෙසේ රතිඤ්ඤා පෙට්ටි දෙස බලා සිටින විට අම්මා පිටමං වී යන්නට ඇතැයි ඔහුට සිතිණ.

4. බොත්තම් විකුණන මිනිසා.

5. අවුරුද්දට ගෙදර යාම පියසේනට සිහිනයක් පමණක් වන බව කතුවරයා ඉඟි කර ඇත.

## ලිඛිත අභ්‍යාස

1. පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කා හට කුමන අවස්ථාවක කියන ලද දැයි ලියන්න.

   i. "මන් උඹ අවුරුද්දට එක්ක යන්න එනවා"

   ii. "අතේ බලා ගන්න හොඳ හැටි"

   iii. "අපේ අම්මාට මොකවත් වුණොතිනුත් දන්නනව ද?"

   iv. "එහෙනම් ඒක ගන්න හැදුවේ, පලයන් යන්න"

   v. "උඹේ අම්ම රෙදි හැට්ට අඳින එක්කෙනෙක් නේද?"

## ලිඛිත අභ්‍යාස

1.

I. අම්මා විසින් පියසේනට, නිවසෙන් පිට වෙන අවස්ථාවේ.

II. අම්මා විසින් ස්වාමි දුවට, පියසේන කාරයට ගොඩ වුණු විට

III. පියසේන විසින් කුස්සි අම්මාට, තම මවට අනතුරක් වුනාදැයි සිතුනු අවස්ථාවේ

IV. රතිඤ්ඤා විකුණන මිනිසා විසින් පියසේනට, රතිඤ්ඤා පෙට්ටියක් අතාගා බැලීමට ගිය අවස්ථාවේ

V. බොත්තම් විකුණන මිනිසා විසින් පියසේනට, අම්මා ගැන විමසූ අවස්ථාවේ

2. පහත සඳහන් සිද්ධි අනුපිළිවෙළට සකසා නැවත ලියන්න.

i. අවුරුදු දිනය හෙටට යෙදී තිබෙන බැවින් මව එන්නේ දැයි විමසිල්ලෙන් බලයි.

ii. නිවසින් පිට වී යන්නට නොහැකි බව පවසමින් හඬා වැටෙද්දී මව තමා කාරයට නංවා හිස සිඹ සනසයි.

iii. මව අනතුරකට පත් වී දැ'යි බියක් දැනී කුස්සි අම්මාගෙන් එවැනි සිද්ධි ගැන තොරතුරු විමසයි.

iv. කාරයෙන් පැමිණි අය ඔහු මෙහෙකාර දරුවකු ලෙස නිවසකට කැඳවා ගෙන එයි.

v. අවුරුද්දට දින කීපයකට පෙර මවට ලිපියක් යවයි.

vi. අම්මාට පණිවිඩයක් යැවීමට කොබෝගම ගැන දන්නා කෙනකු සොයද්දී කපටි මිනිසකුට රැවටෙයි.

vii. නෝනා මහත්මයාට කතුර දීමට ගිය අවස්ථාවේ අමතක වී, ගෙය පිටමං කර යන මව මග හැරුණේ යයි සිතා ගේට්ටුව දෙසට දුව යයි.

viii. තමා කැඳවා ගෙන යාමට එන බවට මව දුන් පොරොන්දුව සිහි කරමින් ඇඳිරි වැටෙන තුරු පාර දෙස ලබා සිටිද්දී නිවස හා එහි වෙසෙන්නන් සිහියට නැගෙයි.

ix. අවුරුදු භාණ්ඩවලට සිත ඇදී යද්දී තම පියා සහ ඔහුගේ මරණය සිහියට නැගෙයි.

x. කිසිවෙකුට හෝ ඇල්ලීමටවත් ඉඩ නො දෙන ලෙස කියා මව භාරයේ තබා ආ කපුමල්ල නිවැසියන් නැති කර ඇති බව සිහිනයෙන් දකියි.

2.

I. නිවසින් පිට වී යන්නට නොහැකි බව පවසමින් හඬා වැටෙද්දී මව තමා කාරයට නංවා හිස සිඹ සනසයි.

II. කාරයෙන් පැමිණි අය ඔහු මෙහෙකාර දරුවකු ලෙස නිවසකට කැඳවා ගෙන එයි.

III. අවුරුද්දට දින කීපයකට පෙර මවට ලිපියක් යවයි.

IV. අවුරුදු දිනය හෙටට යෙදී තිබෙන බැවින් මව එන්නේ දැයි විමසිල්ලෙන් බලයි.

V. නෝන මහත්මයාට කතුර දීමට ගිය අවස්ථාවේ අමතක වී, ගෙය පිටමං කර යන මව මග හැරුණේ යයි සිතා ගේට්ටුව දෙසට දුව යයි.

VI. මව අනතුරකට පත් වී දැ'යි බියක් දැනී කුස්සි අම්මාගෙන් එවැනි සිද්ධි ගැන තොරතුරු විමසයි.

VII. අවුරුදු භාණ්ඩවලට සිත ඇදී යද්දී තම පියා සහ ඔහුගේ මරණය සිහියට නැගෙයි.

VIII. අම්මාට පණිවිඩයක් යැවීමට කොබෝගම ගැන දන්නා කෙනකු සොයද්දී කපටි මිනිසකුට රැවටෙයි.

IX. තමා කැඳවා ගෙන යාමට එන බවට මව දුන් පොරොන්දුව සිහි කරමින් ඇඳිරි වැටෙන තුරු පාර දෙස ලබා සිටිද්දී නිවස හා එහි වෙසෙන්නන් සිහියට නැගෙයි.

X. කිසිවෙකුට හෝ ඇල්ලීමටවත් ඉඩ නො දෙන ලෙස කියා මව භාරයේ තබා ආ කපුමල්ල නිවැසියන් නැති කර ඇති බව සිහිනයෙන් දකියි.

> 3. මේ කෙටිකතාවේ ඇතුළත්, සිතෙහි මැවෙන අවස්ථා විස්තර කරන්න.
>
> 4. මවගේ පැමිණීම හා අවුරුද්ද ගත කරන ආකාරය ගැන පියසේනගේ හිත තුළ පවතින බලාපොරොත්තුව නිරූපණය වන අවස්ථා විස්තර කරන්න.
>
> 5. කෙටිකතාවේ අවසානය ඔබ කැමති ආකාරයකට නිර්මාණය කර මේ කතාව ඉදිරියට ගොඩනගන්න.

3.

- ✓ "අවුරුදු සිහිනය" කතාවේ පියසේන තමන් ගෙදර කැඳවා ගෙන යනු පිණිස අම්මාගේ පැමිණීම බලාපොරොත්තුවෙන් ඉන්නේ අවුරුද්දට ගෙදර යැමටය. කතුවරයා දක්වා ඇති ලෙසට අම්මාගේ පැමිණීම බලාපොරොත්තුවෙන් ඉස්තෝප්පුවෙහි උළුවස්සට හේත්තු වී බලා සිටින පියසේනගේ දසුන පාඨකයාගේ සිතෙහි මැවෙන අවස්ථාවකි.

- ✓ ස්වාමි දුව විසින් කඩ පිලට යවනු ලැබූ පියසේන "කොබෝගම දන්නවාදැයි" වෙළෙඳකුගෙන් අසයි. තමන්ගෙන් බඩු ගත්තොත් තමන් අම්මාට පණිවිඩය දෙන බව වෙළෙන්දා පියසේනට කියයි. වෙළෙන්දාව විශ්වාස කරන පියසේන අම්මාට නොවරදවා පණිවිඩය ලැබෙනු ඇතැයි සන්තෝෂයෙන් පසු වෙයි. එම අවස්ථාවේ සතුටින් ඉපිල යන පියසේනගේ දසුන පාඨකයාගේ සිතෙහි මැවෙන අවස්ථාවකි.

- ✓ පියසේන තමන් ගෙදර ගොස් නිවසේ අය හා එක් වනු සිහිනෙන් දකියි. මෙම අවස්ථාව ද කෙටිකතාවේ ඇතුළත්, සිතෙහි මැවෙන අපූරු අවස්ථාවකි.

4.

- ✓ ලාංකීය සමාජයේ වඩා වැදගත් වන්නේ සිංහල අලුත් අවුරුද්දයි. පියසේනට ලියන්නට බැරිය. දින දෙක තුනකට පෙර ඔහු අම්මාට ලියුමක් ලියවා ගත්තේ කුස්සි අම්මාට කියාය. මවගේ පැමිණීම හා අවුරුද්ද ගත කරන ආකාරය ගැන පියසේනගේ හිත තුළ පවතින බලාපොරොත්තුව මෙන් ම උත්සවය ගැන ඔහුගේ සුන්දර හැඟීම් ඒ ලියුමෙහි ගම්‍යමාන වේ.

✓ ගමෙහි හැම තැන ම උන්චිල්ලා බැඳ ඇත. මෙවර ගෙදරත් උන්චිල්ලාවක් බඳින්නට ඇත් ද? එසේ බැන්දා නම් එය බඳින්නට ඇත්තේ අගල අද්දර කොස් ගසෙහි අත්තක විය යුතු ය. ගිය අවුරුද්දේ බැන්දේ ද එතන ම ය. තාත්තා නැති නිසා උන්චිල්ලාවක් බැඳීමට කෙනකු නොමැති යයි ද ඔහුට සිතිණ. කෙසේ වුව ද, දැන් සිරිසේනත් විජයපාලත් අන් අය සමග එකතු වී ගෙයි පිළිකන්නෙහි දොඩම් ගස යට වල කජ්ජු ගසනු ඇත. ගිය අවුරුද්දෙහි තමා තරම් කිසිවෙක් නො දිනුවේ ය. ගිය අවුරුද්දෙහි දිනූ කජු සියල්ල ඔහු මල්ලක දමා දුමෙහි තැබුවේ මෙහි එන්නට සුමානයකට පෙර ය. මෙලෙස පියසේනගේ සිතෙහි ඇති වන සිතිවිලි වලින් පසුගිය අවුරුද්ද මෙන් මෙවර අවුරුද්ද ද ගත කරන්නට පියසේනගේ හිත තුළ පවතින බලාපොරොත්තුව මැනවින් නිරූපණය වේ.

5.

✓ ශෝකයෙන් නින්දට ගිය පියසේන පසු දින උදෑසන අවදි වූයේ සුපුරුදු කටහඬක් දෙසවන වැකීමෙනි. වටපිට බැලූ ඔහුට තවමත් දකින්නේ සිහිනයක් දැයි අදහාගත නොහැකි විය. ඔහුගේ මව ඔහු ඉදිරිපිට ය. සන්තෝෂ ඉහ වහා ගිය පියසේන මවට තුරුලු විය.

"අම්මා කොයි වෙලාවෙ ද ආවෙ?" ඔහුව ඉවසුම් නැත.

කුස්සි අම්මා පිළියෙල කර තිබූ උදෑසන ආහාරය කඩිමුඩියේ රසවිඳි පියසේන ස්වාමි දුවට වැඳ අවසර ගෙන මවත් සමග නිවස වෙත ගියේ දිගු ගමනකින් අනතුරුව ය. නිවසට යන විටත් ගොළු මල්ලීත් නංගීත් ඔහු එනතුරු මග බලාගෙන සිටියහ. මල්ලී අත ඔහුගේ කජු මල්ල ද විය. දුවගෙන ආ නංගී ඔහුගේ ඇඟ කෙනිත්තුවා ය.



පාඩම් ඒකකය - අවුරුදු සිහිනය | ශ්‍රේණිය - 8 ශ්‍රේණිය

ගුරුවරයාගේ නම - එච්. ඩබ්. තමරා නිල්මිණී | කලාප අධ්‍යාපන කාර්යාලය , අම්පාර

1) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i. අවුරුදු සිහිනය කෙටි කතාවේ රචකයා නම් කරන්න.

.............................................................................................................................

ii. එම කෙටි කතාව උපුටාගත් කෙටිකතා සංග්‍රහය කුමක්ද?

.............................................................................................................................

iii. ඔහු කරන ලද සාහිත්‍ය ග්‍රන්ථ ඇසුරින් පහත වගුව පුරවන්න.

| කාව්‍ය ග්‍රන්ථ | නවකතා | කෙටිකතා |
|---|---|---|
| a)<br>b)<br>c)<br>d)<br>e) | | |

iv. මෙම කෙටිකතාවේ ප්‍රධාන චරිතය හා ඔහුගේ වයස ලියන්න.

.............................................................................................................................

v. මෙම කෙටිකතාවට හේතු වූ ප්‍රධාන සිද්ධිය කෙටියෙන් ලියන්න.

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

vi. කෙටි කතාවේ දී අපට හමු වන සෙසු චරිත නම් කරන්න.

.............................................................................................................................

.............................................................................................................................

vii. ළමා වියේ දීම සිය නිවසින් පිටවීමට පියසේනට සිදු වූයේ ඇයි?

.............................................................................................................................

viii. පියසේන උළුවස්සට හේත්තු වී පාර බලා සිටීමට හේතුව කුමක් ද?

.............................................................................................................................

ix. අම්මාගේ ප්‍රමාදය පියසේනගේ ශෝකයට හේතු වූයේ ඇයි?

.............................................................................................................................

x. පියසේනට බලවත් ප්‍රීතියක් ඇති වීමට හේතු වූ කුස්සි අම්මාගේ ප්‍රකාශය උපුටා දක්වන්න.

.............................................................................................................................

.............................................................................................................................

xi. කඩ වීථියේ දී පියසේනගේ සිත්ගත් දේවල් නම් කරන්න.

..................................................................................................................................

..................................................................................................................................

xii. පියසේන දුටු සිහිනය ගැන ඔබට හැඟෙන දේ ලියන්න.

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

2) පහත සඳහන් ප්‍රකාශන කවුරුන් විසින් කා හට කුමන අවස්ථාවකදී කියන ලදදැයි ලියන්න.

| ප්‍රකාශය | කිව්වේ කවුද? | කිව්වේ කාටද? | අවස්ථාව |
|---|---|---|---|
| i. ‘මේ කතුර නෝනා මහත්මයාට ගිහින් දීපන් | | | |
| ii. ‘අම්මා මෙච්චර වෙලා නාවේ ඇයි?‘ | | | |
| iii. ‘මොකක්ද මට තේරෙන්නේ නැහැ‘ | | | |
| iv. ‘පියසේන, මෙහෙ වරෙන්‘ | | | |
| v. ‘නූල් රෝද දෙකක්. සුදු ඒව‘ | | | |
| vi. ~~උඹ ළඟ සල්ලි~~ තියනව ද?‘ | | | |
| vii. ‘කෝ..... කජු මල්ල...? කෝ.....?‘ | | | |

3) පහත සඳහන් ප්‍රකාශන නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද වරහන් තුළ යොදන්න.

i. අඹ යහළුවෝ හා මඩොල් දූව ළමා නව කතා ය. ( )

ii. දීර්ඝ කාලයක සිදු වූ සිදුවීම් නවකතාවක දිගහැරෙයි. ( )

iii. කෙටි කතාවක එක් ප්‍රබල සිද්ධියක් ඉස්මතු වී තිබේ. ( )

iv. කෙටිකතාකරුවා තම නිර්මාණය රසවත් කරන්නේ භාෂාවෙනි. ( )

v. සාර්ථක කෙටිකතාවක් පාඨක සිතට කිසිම හැඟීමක් එක් නොකරයි. ( )

vi. කෙටි කතාව කියවා රසවිඳ අවසන් වන විට පාඨකයා අපූරු ලෝකයකට පිවිසෙයි( )

4) අවුරුදු සිහිනය කෙටි කතාවේ අවසානය ඔබට කැමති ආකාරයකට වෙනස් කර ලියන්න.

5) ඔබේ ළමා වියේ අත්දැකීමක් මුල් කරගෙන මෙබඳු රසවත් කෙටි කතාවක් ලියන්න.

සවියෙන් පෙරට අපි එකට

e - ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම/ ඒකකය/ ඇගයීම |
|---|---|---|---|
| 08 | සිංහල භාෂාව හා සාහිත්‍යය | පළමු වාරය | අවුරුදු සිහිනය |

සැකසුම : ටී. ඩී. සසන්ති සිල්වා

බප/හො/ ශ්‍රී සුමංගල මහා විද්‍යාලය

ඔලබොඩුව

(1)vඅවුරුදු සිහිනයී පාඩම උපුටාගෙන ඇත්තේ කුමන කෙටිකතා සංග්‍රහයෙන්ද?

(2)එය රචනා කළ කතුවරයා කවුරුන්ද?

(3)ඔහු වෘත්තියෙන් කුමන රැකියාවක නිරත වූයෙක්ද?

(4)එතුමා විසින් රචනාකරන ලද කෘති කිහිපයක් ලියා දක්වන්න.

(5)මෙම කතාවේ ප්‍රධාන චරිතය කාගේද?

(6)ගෙදර යෑමට පියසේන තුළ වූ ආශාවෙන් අයුතු ලෙස ප්‍රයෝජන ගත්තේ කවුරුන්ද?

(7)මෙම කතාවේ චිත්ත රූප මැවෙන අවස්ථා කෙටියෙන් පහදන්න.

(8)නිවසින් පිටව ජීවත් වීමට පියසේනට සිදුවූයේ ඇයි?

(9)පාඨක සිත දුක අනුකම්පාව සතුට වැනි හැඟීම් පුරවාලන අවස්ථා මොනවාද?

පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කාහට කුමන අවස්ථාවක කියන ලද දැයි ලියන්න.

- vකෝ ...... කජුමල්ල ? කෝ.....ී
- vකොහොම හරි කියන්න හෙට උදේම එන්නය කියලාී
- vමොකද විඩක් ඕනද?v
- ීඋඹ සල්ලි එහෙම නැති කරව ගන්න නෙවෙයිv
- ීදැන් ඇති උළුවස්සේ එල්ලිලා..... හනිකට වරෙන්v

# 9 – පාඩම අවුරුදු සිහිනය

## ක්‍රියාකාරකම 1

❖ සුදුසු පිළිතුර තෝරා පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කරන්න.

1. ..................... නවකතාවක් මෙන් දිග කතාවක් නොවේ .

   i බණ කතාව   ii කෙටිකතාව   iii ජන කතාව   iv චරිත කතාව

2 . කෙටි කතාවක ලක්ෂණයක් **නොවන්නේ**

   i එක් ප්‍රබල චරිතයක්   ii එක් සිදුවීමක්   iii සංක්ෂිප්ත බව   iv සිදුවීම් ගණනාවක් ඇතුළත් වීම

3 . " අවුරුදු සිහිනය " කෙටිකතාව ........................ කෘතියෙන් උපුටා ගෙන ඇත .

   i රතු රෝසමල   ii කරුමක්කාරයෝ   iii දෙපා නොලද්දෝ   iv අමල් බිසෝ

4 . ගුණදාස අමරසේකර මහතාගේ කෘතියක් **නොවන්නේ**

   i ගම් පෙරළිය   ii විල්තෙර මරණය   iii යළි උපන්නෙමි   iv රතු රෝස මල

5 . ගුණදාස අමරසේකර මහතා වෘත්තියෙන් ......................... වේ .

   i ගුරුවරයෙක්   ii ගීත රචකයෙක්   iii වෛද්‍යවරයෙක්   iv ගායකයෙක්

## ක්‍රියාකාරකම 2

**★වරහන් තුළින් පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න .**

1. පියසේන තම මවට ලිපයක් යැව්වේ ................................. ඉල්ලාය .

   ( පොත් ගැනීමට මුදල් / අලුත් ඇඳුම් ගැනීමට මුදල් / අවුරුද්දට ගමට එක්ක යන ලෙස )

2 . අම්මා පමා වන විට පියසේන තුළ බියක් ඇති වූයේ ........................... ය .

   ( මගදී අනතුරක් සිදුවීම නිසා / මගදී අනතුරක් සිදු වී දැයි සිතුණ නිසා / පියසේනට ගුටි කන්නට සිදුවන නිසා )

3 . පියසේන නූල් රෝදයක් ගෙන ඒමට සතුටින් ගියේ ........................ නිසා ය .

   ( අම්මා මග දි හමු විය හැකි / රස කැවිලි කෑ හැකි / නගරට යාමට ඇති ආශාව )

4 . බොත්තමක් මිලදී ගැනීමට පියසේන පෙළඹුණේ ................................ අවශ්‍ය නිසා ය .

   ( කමිසයට ඇල්ලීමට / අම්මාට පණිවිඩය යැවීමට / ස්වාමිදූවට ගෙන යාමට )

5 . පියසේන දුටු සිහිනයෙන් කතුවරයා ප්‍රකාශ කරන්නේ ............................. යි .

   ( ස්වාමිදූවගේ අකාරුණික බව / අම්මා පැමිණි බව / අවුරුද්දට ගෙදර යෑමේ ආශාව )





## ක්‍රියාකාරකම 3

"අ" කොටසේ සඳහන් යෙදුමේ අදහස "ආ" කොටසෙන් තෝරා යා කරන්න .

| අ | ආ |
|---|---|
| 1 . පාඨකයා | සිතෙහි මැවෙන රූප |
| 2 . කුතුහලය | ලේඛන කාර්යයෙහි යෙදෙන්නා |
| 3 . ප්‍රේක්ෂකයා | කියවන්නා |
| 4 . චිත්තරූප | යමක් දැන ගැනීමට ඇති ආශාව |
| 5. ලේඛකයා | නරඹන්නා |



## ක්‍රියාකාරකම 4

පහත සඳහන් පාඨවල අවස්ථා සම්බන්ධය (කවුරුන් විසින් කා හට කුමන අවස්ථාවේ ) ලියන්න.

| අ අ | පාඨය | කවුරුන් විසින් | කා හට | අවස්ථාව |
|---|---|---|---|---|
| 1 | " ඔව් , කවුරුනුත් දන්වනවා .කාටත් එහෙමයි " | | | |
| 2 | "උඹ සල්ලි එහෙම නැති කරව ගන්න නෙවෙයි " | | | |
| 3 | "උඹ ළඟ සල්ලි තියෙනව ද ? " | | | |
| 4 | " පලයන් යන්න කොබෝගම ගැන අහන්න ආවා " | | | |
| 5 | "කෝ කජු මල්ල.... ? කෝ.... ? උඹලා නැති කරලා" | | | |
| 6 | " ඔව් , කියන්න කොහොම හරි මාව එක්ක යන්න එන්නයි කියලා හෙට උදේම . " | | | |
| 7 | "අනේ බලා ගන්න හොඳ හැටි " | | | |
| 8 | "පොලිසියෙන් දන්වන්වා ඒ ඉන්න තැනකට " | | | |

❖ ## ක්‍රියාකාරකම 5

**පහත සඳහන් එක් එක් වාච්‍යාර්ථවලට ගැළපෙන යෙදුම් පාඩමෙන් සොයා ලියන්න .**

1 .ඔහුගේ සිතේ සතුටක් ඇතිවිණි . …………………………………………………...

2 . පියසේනගේ සිතට ශෝකයක් ඇතිවිය . ……………………………………………..

3 .ක්‍රමයෙන් ඉර බැස යයි ……………………………………………………………….

4 . පුදුම වූ බව ඔහුගේ දෙනෙත්වලින් පෙනෙන්නට විය . …………………………………………………..

5. ඔහු නොඉවසිල්ලෙන් පාර දෙස බලා සිටින්නට විය ………………………………………



හිරු එළිය ද දැන් ක්‍රමයෙන් ගෙවී යයි .

පියසේනගේ සිත ශෝකයෙන් පිරෙන්නට විය

ඔහු ඇඟිලිතුඩින් නැඟී පාර දෙස බලා සිටින්නට විය .

ඔහුගේ සිත ප්‍රීතියෙන් සිනාසෙන්නට විය

ඔහුගේ දෑස විස්මයෙන් වෙළී ගියේ ය

❖ ## ක්‍රියාකාරකම 6

පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් √ ලකුණ ද වැරදි නම් X ලකුණ ද යොදන්න

| | |
|---|---|
| 1 . කෙටි කතාවක ඇත්තේ ප්‍රධාන සිද්ධි එකකි . | |
| 2 . භාෂාව කෙටි කතාවක සාර්ථකත්වයට බෙහෙවින් බලපායි . | |
| 3 . දීර්ඝ කාලයක් තිස්සේ සිදුවුණු සිදුවීම් දිග හැරෙන කතා කෙටි කතා ය . | |
| 4 . කෙටි කතාවක අවස්ථා හා සිද්ධි අතර මනා සම්බන්ධතාවයක් පවතී . | |
| 5 . නවකතාවක ප්‍රධාන චරිත ඇත්තේ එකක් පමණි . | |
| 6 . කෙටි කතාවක ප්‍රධාන සිද්ධිය හැඩ කරන්නේ අවශේෂ සිද්ධි සමූහය යි . | |
| 7 .දක්ෂ කෙටිකතාකරුවා රූප මවමින් නිර්මාණය රසවත් කරන්නේ භාෂාව මඟිනි . | |
| 8 . අඹ යාළුවෝ කෙටිකතාවකට උදාහරණයකි . | |
| 9 . නවකතාවක එක් එක් සිදුවීමට අදාළ ව එක් එක් පුද්ගල කණ්ඩායම් වේ . | |
| 10 . හැඟීම් දැනෙන ආකාරයට කතාව ඉදිරිපත් කර තිබීම සාර්ථක කෙටිකතාවක ලක්ෂණයකි . | |

# පිළිතුරු



**Answer**

1.

I. ගුණදාස අමරසේකර මහතා

II. රතු රෝස මල

III. කාව්‍ය සංග්‍රහ - භාව ගීත, අමල් බිසෝ, උයනක හිඳ ලියූ කවි, ආවර්ජනා, අසක් දා කව, මතක වත

නවකතා - කරුමක්කාරයෝ, යළි උපන්නෙමි, දෙපා නොලද්දෝ, ගන්ධබ්බ අපදානය, අසත්‍ය කතාවක්, ප්‍රේමයේ සත්‍ය කතාව, ගමනක මුල

කෙටිකතා සංග්‍රහ - රතු රෝස මල, ජීවන සුවඳ, එක ම කතාව, එක්ටැමෙන් පොළොවට, කතා පහක්, ගල් පිළිමය සහ බොල් පිළිමය, මරණ මංචකයේ දුටු සිහිනය, පිළිම ලොවයි පියවි ලොවයි, විල්තෙර මරණය ආදි

IV. පියසේන, අවුරුදු නවයයි

V. අවුරුද්දට තමා ගමට රැගෙන යාමට තම මවගේ පැමිණීම පිළිබඳව පියසේනගේ හිත තුළ පවතින බලාපොරොත්තුව

VI. පියසේනගේ මව, කුස්සි අම්මා, නෝන මහත්මය (ස්වාමිදුව), ගොළු මල්ලි, නංගී, බැලුන් විකුණන මිනිසා, රතිඤ්ඤා විකුණන මිනිසා, පත්තරය කියවන මිනිසා, බුලත්විට විකුණන තරබාරු ගෑනියක්, බොත්තම් විකුණන මිනිසා

VII. ඔහුගේ පියා මිය යාමත් සමග ඇති වූ අග හිඟ කම් නිසා පොහොසත් ගෙදරක වැඩට යාමට සිදු වීමෙන්

VIII. තම අම්මා එන තුරු

IX. අම්මාට කරදරයක් වුණාදැයි සිතීම නිසා

X. “පොලිසියෙන් දන්වනවා ඒ ඉන්න තැනට.”

XI. හුළං පුරවන ලද බැලුන්, රතිඤ්ඤා පෙට්ටියෙහි පිට වූ මහත ගැහැනියකගේ රූපය

XII. අවුරුද්දට ගෙදර යාම පියසේනට සිහිනයක් පමණක් වන බව කතුවරයා ඉඟි කර ඇත.

2.

I. කුස්සියේ අම්මා විසින් පියසේනට, පියසේන ඉස්තෝප්පුවෙහි උළුවස්සට හේත්තු වී අම්මා එන තුරු බලා සිටි අවස්ථාව.

II. පියසේන විසින් තමාටම, ඔහු යළිත් උළුවස්ස අසලට පැමිණ වීථිය දෙස බලා සිටිමින් කල්පනා කරන අවස්ථාව.

III. කුස්සියේ අම්මා විසින් පියසේනට, කාටවත් මොකවත් වුණොත් දැන ගන්නේ කොහොම දැ යි ඇසූ අවස්ථාව.

IV. ස්වාමිදුව විසින් පියසේනට, පියසේන උළුවස්සේ එල්ලී අම්මා ගැන කල්පනා කරනමින් සිටි අවස්ථාව

V. පියසේන විසින් ස්වාමිදුවට, ස්වාමිදුව, කඩේට ගොස් නූල් රෝද දෙකක් රැගෙන ඒමට කියා යළිත් ඒ ගැන ඇසූ අවස්ථාව.

VI. නපුරු පෙනුමකින් යුත් මිනිහා විසින් පියසේනට, පියසේන විසින් රතිඤ්ඤා පෙට්ටියක් අල්ලා බැලීමට අත යවන අවස්ථාව.

VII. පියසේන විසින් තමාටම, ඔහු සිහිනෙන් තමා ගෙදර ගොස් සිටින බව දුටු අවස්ථාව.

3.

| | | | |
|---|---|---|---|
| I. | √ | IV. | √ |
| II. | √ | V. | X |
| III. | √ | VI. | √ |

4. ශෝකයෙන් නින්දට ගිය පියසේන පසු දින උදෑසන අවදි වූයේ සුපුරුදු කටහඬක් දෙසවන වැකීමෙනි. වටපිට බැලූ ඔහුට තවමත් දකින්නේ සිහිනයක් දැයි අදහාගත නොහැකි විය. ඔහුගේ මව ඔහු ඉදිරිපිට ය. සන්තෝෂ ඉහ වහා ගිය පියසේන මවට තුරුලු විය.

"අම්මා කොයි වෙලාවෙ ද ආවෙ?" ඔහුව ඉවසුම් නැත.

කුස්සි අම්මා පිළියෙල කර තිබූ උදෑසන ආහාරය කඩිමුඩියේ රසවිඳි පියසේන ස්වාමි දුවට වැඳ අවසර ගෙන මවත් සමග නිවස වෙත ගියේ දිගු ගමනකින් අනතුරුව ය. නිවසට යන විටත් ගොළු මල්ලීත් නංගීත් ඔහු එනතුරු මඟ බලාගෙන සිටියහ. මල්ලී අත ඔහුගේ කජු මල්ල ද විය. දුවගෙන ආ නංගී ඔහුගේ ඇඟ කෙනිත්තුවා ය.

5. -

1. රතු රෝස මල
2. ගුණදාස අමරසේකර මහතා
3. දන්ත වෛද්‍යවරයෙකි
4. **කාව්‍ය සංග්‍රහ** - භාව ගීත, අමල් බිසෝ, උයනක හිඳ ලියූ කවි, ආවර්ජනා, අසක් දා කව, මතක වත
   **නවකතා** - කරුමක්කාරයෝ, යළි උපන්නෙමි, දෙපා නොලද්දෝ, ගන්ධබ්බ අපදානය, අසත්‍ය කතාවක්, ප්‍රේමයේ සත්‍ය කතාව, ගමනක මුල
   **කෙටිකතා සංග්‍රහ** - රතු රෝස මල, ජීවන සුවඳ, එක ම කතාව, එක්ටැමෙන් පොළොවට, කතා පහක්, ගල් පිළිමය සහ බොල් පිළිමය, මරණ මංචකයේ දුටු සිහිනය, පිළිම ලොවයි පියවි ලොවයි, විල්තෙර මරණය ආදි
5. පියසේන
6. බොත්තම් විකුණන මිනිසා
7.

✓ "අවුරුදු සිහිනය" කතාවේ පියසේන තමන් ගෙදර කැඳවා ගෙන යනු පිණිස අම්මාගේ පැමිණීම බලාපොරොත්තුවෙන් ඉන්නේ අවුරුද්දට ගෙදර යැමටය. කතුවරයා දක්වා ඇති ලෙසට අම්මාගේ පැමිණීම බලාපොරොත්තුවෙන් ඉස්තෝප්පුවෙහි උළුවස්සට හේත්තු වී බලා සිටින පියසේනගේ දසුන පාඨකයාගේ සිතෙහි මැවෙන අවස්ථාවකි.

✓ ස්වාමි දුව විසින් කඩ පිලට යවනු ලැබූ පියසේන "කොබෝගම දන්නවාදැයි" වෙළෙඳකුගෙන් අසයි. තමන්ගෙන් බඩු ගත්තොත් තමන් අම්මාට පණිවිඩය දෙන බව වෙළෙන්දා පියසේනට කියයි. වෙළෙන්දාව විශ්වාස කරන පියසේන අම්මාට නොවරදවා පණිවිඩය ලැබෙනු ඇතැයි සන්තෝෂයෙන් පසු වෙයි. එම අවස්ථාවේ සතුටින් ඉපිල යන පියසේනගේ දසුන පාඨකයාගේ සිතෙහි මැවෙන අවස්ථාවකි.

✓ පියසේන තමන් ගෙදර ගොස් නිවසේ අය හා එක් වනු සිහිනෙන් දකියි. මෙම අවස්ථාව ද කෙටිකතාවේ ඇතුළත්, සිතෙහි මැවෙන අපූරු අවස්ථාවකි.

8.

✓ පියසේන ඉස්තෝප්පුවෙහි උළුවස්සට හේත්තු වී අවුරුද්දට තමා ගමට රැගෙන යාමට තම මවගේ පැමිණීම පිළිබඳව අපේක්ෂාවෙන් බලා සිටින ආකාරය සිතට ශෝකයක් ඇති කරයි.

✓ හුළං පුරවන ලද බැලුන් කෙරෙහි ද රතිඤ්ඤා පෙට්ටි කෙරෙහි ද ඇදී ගිය සිත් ඇති පියසේන කෙරෙහි අනුකම්පාවක් ඇති වෙයි.

✓ ඉතිරි සල්ලි වලින් සත දහයක් දුන් පියසේනගෙන් කිසිවෙක් ඒ ගැන ප්‍රශ්න නො කළ බව දැන ගැනීමෙන් පාඨකයාගේ සිතෙහි සතුටක් ඇති වේ.

9.

I. පියසේන විසින් තමාටම, ඔහු සිහිනෙන් තමා ගෙදර ගොස් සිටින බව දුටු අවස්ථාව.

II. පියසේන විසින් බොත්තම් විකුණන මිනිසාට, කොබෝගම ගැන දන්නවා යැයි කිවූ අවස්ථාව.

III. බුලත්විටි විකුණන තරබාරු ගැහැනිය විසින් පියසේනට, මව ගැන විමසීමට සිතා පියසේන ඈ වෙතට සෙමෙන් ළං වූ අවස්ථාව.

IV. ස්වාමිදුව විසින් පියසේනට, කඬේට ගොස්, නූල් රෝද දෙකක් රැගෙන ඒමට කියූ අවස්ථාව.

V. ස්වාමිදුව විසින් පියසේනට, අම්මා දැන් ළඟ ළඟ ම එනවා ඇතැයි සිතමින් පියසේන යළිත් ඉස්තෝප්පුවට දුව ආ අවස්ථාව.



❖

# පිළිතුරු

## ක්‍රියාකාරකම 1

1 . කෙටිකතාව

2 . සිදුවීම් ගණනාවක් ඇතුළත් වීම

3 . රතු රෝසමල

4 . ගම්පෙරළිය

5 . වෛද්‍යවරයෙක්

## ක්‍රියාකාරකම 2

1 . අවුරුද්දට ගමට එක්ක යන ලෙස

2 . මගදී අනතුරක් සිදු වී දැයි සිතුණ නිසා

3 . අම්මා මග දි හමු විය හැකි

4 . අම්මාට පණිවිඩය යැවීමට

5 . අවුරුද්දට ගෙදර යෑමේ ආශාව

## ක්‍රියාකාරකම 3

1 . කියවන්නා

2 . යමක් දැන ගැනීමට ඇති ආශාව

3 . නරඹන්නා

4 . සිතෙහි මැවෙන රූප

5 . ලේඛන කාර්යයෙහි යෙදෙන්නා

## ❖ ක්‍රියාකාරකම 4

| | කවුරුන් විසින් | කා හට | අවස්ථාව |
|---|---|---|---|
| 1 | කුස්සියේ සිටි ගැහැනිය | පියසේනට | අම්මාට මොකක් වුණාද යි දැන ගැනීමට හැකි ක්‍රමයක් විමසන අවස්ථාව |
| 2 | ස්වාමිදුව | පියසේනට | නූල් රෝද දෙකක් ගෙන එන්නට පියසේනට කියන ලද අවස්ථාව |
| 3 | රතිඤ්ඤා මුදලාලි | පියසේනට | රතිඤ්ඤා පෙට්ටි ගොඩ ඇල්ලූ අවස්ථාව |
| 4 | බුලත් විට විකුණන ආච්චි | පියසේනට | කොබෝගම ගැන දන්න කෙනෙක් ද යන්න විමසූ අවස්ථාව |
| 5 | පියසේන | පියසේනට | පසු දින ගෙදර යාමට සිතා සතුටින් නිදා සිටිද්දී හීනයක් දකින අවස්ථාව |
| 6 | පියසේන | බොත්තම් මුදලාලිට | කොබෝගම ගැන දන්න කෙනෙක් බව පියසේනට හැඟ වූ අවස්ථාව |
| 7 | පියසේනගේ මව | ස්වාමිදූවට | පියසේන කොළඹට යාමට කාරයට නඟින අවස්ථාව |
| 8 | කුස්සියේ සිටි ගැහැනිය | පියසේනට | අම්මාට මොකක් වුණාද යි දැන ගැනීමට හැකි ක්‍රමයක් විමසන අවස්ථාව |

## ❖ ක්‍රියාකාරකම 5

1 . ඔහුගේ සිත ප්‍රීතියෙන් සිනාසෙන්නට විය .

2 . පියසේනගේ සිත ශෝකයෙන් පිරෙන්නට විය

3 . හිරු එළිය ද දැන් ක්‍රමයෙන් ගෙවී යයි .

4 . ඔහුගේ දෑස විස්මයෙන් වෙළී ගියේ ය

5 . ඔහු ඇඟිලිතුඩින් නැඟී පාර දෙස බලා සිටින්නට විය .

## ක්‍රියාකාරකම 6

1 . √

2 . √

3 . X

4 . √

5 . X

6 . √

7 . √

8 . X

9 . √

10 . √

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

**අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.**

**ස්තූතියි !**

# හසිත හෙට්ටිආරච්චි

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ